# 2

# ජාතික නිෂ්පාදිතය සහ වියදම

ශ්‍රී ලංකා ආර්ථිකය, 2018 වසරේ දී වාර්තා කළ සියයට 3.2 ක වර්ධනයට සාපේක්ෂව, පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාර හේතුවෙන් දෙවන කාර්තුවේ දී ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ඇති වූ අහිතකර බලපෑම් මධ්‍යයේ 2019 වසරේ දී සියයට 3.0 ක පමණ වර්ධනයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. නිල ඇස්තමේන්තුවලට අනුව ශ්‍රී ලංකා ආර්ථිකය 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.9 ක වර්ධනයට සාපේක්ෂව, 2019 වසරේ පළමු භාගයේ දී සියයට 2.6 ක අඩු  වර්ධන වේගයක් වාර්තා කරන ලදී.  පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාර හේතුවෙන් විශේෂයෙන්ම, සංචාරක කර්මාන්තය සහ ඒ ආශ්‍රිත ප්‍රවාහනය වැනි  සේවා කටයුතු සඳහා විශාල බලපෑමක් ඇති විය. වසරේ පළමු භාගය තුළ දී සේවා කටයුතුවල වර්ධනය සඳහා මූල්‍ය සේවා, තොග හා සිල්ලර වෙළඳාම සහ වෙනත් පෞද්ගලික සේවා වැනි කටයුතු ප්‍රධාන වශයෙන්  දායක විය. මේ අතර, ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතුවල දක්නට ලැබුණු යහපත් වර්ධනය වසරේ පළමු භාගයේ දී කර්මාන්ත කටයුතුවල වර්ධනය සඳහා හේතු විය. තවද, තෙල් සහිත පලතුරු භෝග වගාවේ දක්නට ලැබුණු සැලකිය යුතු වර්ධනය මෙන්ම වී වගාවේ හිතකර වර්ධනය ද කෘෂිකර්මාන්ත කටයුතුවල වර්ධනය සඳහා විශාල ලෙස උපකාරී විය. ඉදිරි ප්‍රවණතා සැලකීමේ දී, පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවල බලපෑමට ලක් වූ බොහොමයක් ආර්ථික ක්‍රියාකාරකම්, ආරම්භයේ දී අපේක්ෂා කළ මට්ටමට වඩා වැඩි වේගයකින් යථා තත්ත්වයට පත් වෙමින් පවතින අතර එය වසරේ දෙවන භාගයේ දී ආර්ථික වර්ධනය වේගවත් කිරීමට දායක වනු ඇත. තවද, ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මෙන්ම ඉදිරියෙහි දී පැවැත්වීමට නියමිත මැතිවරණ හේතුවෙන් සිදු විය හැකි රාජ්‍ය වියදම් ඉහළ යෑම ද ආර්ථිකයේ සමස්ත ඉල්ලුම වර්ධනය වීම කෙරෙහි උපකාරී වනු ඇත. එසේ වුවද, වසරේ අග භාගයේ දී සහ 2020 වසරේ දී පැවැත්වීමට නියමිත මැතිවරණ හේතුවෙන් ඇති වන අවිනිශ්චිතතා තුළින් මතුවන අවදානම් ආර්ථික වර්ධන අපේක්ෂා සඳහා අහිතකර බලපෑම් ද ඇති කිරීමට ඉඩ ඇත. තවද, සමස්ත ගෝලීය ආර්ථික පසුබෑම විදේශීය ඉල්ලුම කෙරෙහි අහිතකර ලෙස  බලපානු ඇත. එසේම, අනපේක්ෂිත අහිතකර කාලගුණික තත්ත්වයන් කෘෂිකාර්මික සහ ඒ ආශ්‍රිත ආර්ථික කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය.

## 2019 වසරේ ප්‍රවණතා

### නිෂ්පාදිතය

2

- ශ්‍රී ලංකා ආර්ථිකය, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.9 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ දී සියයට 2.6 ක වර්ධනයක් වාර්තා කරන ලදී. ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන සේවා, කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත කටයුතු 2019 වසරේ පළමු භාගයේ දී, පිළිවෙළින් සියයට 2.8 කින්, සියයට 2.3 කින් සහ සියයට 3.2 කින් වර්ධනය විය. පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාර හේතුවෙන් වසරෙහි දෙවන කාර්තුවේ දී ඇති වූ පසුබෑම මධ්‍යයේ වුව ද මූල්‍ය සේවා, තොග සහ සිල්ලර වෙළඳාම සහ වෙනත් පෞද්ගලික සේවාවන් වර්ධනය වීම වසරේ පළමු භාගය තුළ සේවා ආශ්‍රිත ආර්ථික කටයුතුවල සමස්ත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර එම ප්‍රහාරවල අහිතකර බලපෑම හේතුවෙන් නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්හි පහත වැටීමක් දක්නට ලැබුණු අතර ප්‍රවාහන සේවා මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මේ අතර, ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතු හිතකර ලෙස වර්ධනය වීම වසරේ පළමු භාගය තුළ කර්මාන්ත කටයුතුවල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. තෙල් සහිත පලතුරු භෝග වගාවෙහි (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) සිදු වූ සැලකිය යුතු වර්ධනය මෙන්ම වී වගාවේ හිතකර වර්ධනය ද කෘෂිකාර්මික කටයුතුවල වර්ධනයට ප්‍රධාන වශයෙන් උපකාරී විය.

**2.1 රූප සටහන**
**කාර්තුමය ද.දේ.නි. වර්ධන අනුපාතිකය (අ)**




(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව යටතේ සිදු කරන ලද පුරෝකථනවලට අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය 2018 වසරේ දී වාර්තා කළ සියයට 3.2 ක වර්ධනයට සාපේක්ෂව, 2019 වසරේ දී සියයට 3.0 ක පමණ වර්ධනයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් ආර්ථිකයට සිදු වූ අහිතකර බලපෑම වසරේ දෙවන භාගයේ දී ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි බලාපොරොත්තු වේ. තවද, ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට අනුව වසරේ දෙවන භාගය ආරම්භයේදීම සමස්ත ඉල්ලුම පිළිබඳ අපේක්ෂාවන්ගේ වර්ධනයක් පිළිබිඹු වේ. සේවා කටයුතු පිළිබඳ සැලකීමේ දී පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් සංචාරක කර්මාන්තයේ වූ පසුබෑම, වසරේ දෙවන භාගයේ දී ද නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ කටයුතුවල වර්ධනය සඳහා අහිතකර ලෙස බලපානු ඇත. එසේ වුව ද, අභ්‍යන්තර ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වීමත් සමඟ, අනෙකුත් සේවා කටයුතු සඳහා වන අහිතකර බලපෑම වසරේ දෙවන භාගයේ දී ක්‍රමයෙන් ඉවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, සේවා කටයුතුවල වර්ධනය සඳහා මූල්‍ය සේවා සහ තොග හා සිල්ලර වෙළඳාම් කටයුතුවල වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වනු ඇත. මේ අතර, කර්මාන්ත කටයුතුවල අපේක්ෂිත වර්ධනය කෙරෙහි දේශීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම මෙන්ම රජයේ ඉදිකිරීම් කටයුතුවල අපේක්ෂිත හිතකර වර්ධනය හේතුවෙන් නිෂ්පාදන කර්මාන්ත සහ ඉදිකිරීම් කටයුතු වර්ධනය වීම ප්‍රධාන වශයෙන් උපකාරී වනු ඇත. මේ අතර වසර පුරා හිතකර කාලගුණික තත්ත්වයක් පැවතුණහොත් වසරේ ඉදිරි කාලයේ දී ද කෘෂිකාර්මික කටයුතුවල යහපත් වර්ධනය තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- විශේෂයෙන්ම, 2019 වසරේ දෙවන භාගයේ වර්ධන අපේක්ෂා කෙරෙහි යහපත් මෙන්ම අයහපත් බලපෑම් ඇති විය හැකි අවදානම් තත්ත්ව පවතී. එළැඹෙන මැතිවරණ හේතුවෙන් ඇති විය හැකි වෙතැයි අපේක්ෂිත රජයේ වියදම් ඉහළ යෑම, කෙටිකාලීනව රජයේ මෙන්ම පෞද්ගලික පරිභෝජන වියදම් ඉහළ යෑමට හේතු විය හැක. කෙසේ වුව ද, ව්‍යාපාර සමීක්ෂණ මගින් ද පිළිබිඹු වූ පරිදි මැතිවරණ සමඟ ඇති වන අවිනිශ්චිත වාතාවරණය පෞද්ගලික අංශයේ ආයෝජන තීරණ ප්‍රමාද කිරීමට හේතු විය හැකි අතර එමගින් ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි

2

අහිතකර බලපෑම් ඇති විය හැක. අපේක්ෂිත මට්ටමට වඩා ගෝලීය වර්ධනය දුර්වල වීම විදේශ ඉල්ලුම කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරනු ඇත. එසේම, කාලගුණික තත්ත්වය අයහපත් වුවහොත් එය ප්‍රධාන කෘෂිකාර්මික භෝගවල වර්ධනය අඩාල කිරීමට හේතු විය හැකි අතර, එය කෘෂිකාර්මික කටයුතු හා බැඳුණු ආහාර සකස් කිරීම වැනි නිෂ්පාදන කර්මාන්ත කටයුතු මෙන්ම වෙළඳාම සහ ප්‍රවාහනය වැනි සේවා ආශ්‍රිත කටයුතු කෙරෙහි ද අහිතකර ලෙස බලපෑ හැකිය.

## ආර්ථික කටයුතුවල වර්ධනය

### කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය

- **කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කරන ලද සියයට 5.3 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 3.2 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** වසරේ පළමු භාගය තුළ දී තෙල් සහිත පලතුරු භෝග වගාවෙහි (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) දක්නට ලැබුණු සැලකිය යුතු වර්ධනය මේ සඳහා බෙහෙවින් ඉවහල් විය. තවද, වී වගාව, සත්ත්ව නිෂ්පාදනය, පලතුරු වගාව, රබර් වගාව, වෙනත් බහු වාර්ෂික භෝග වගා කිරීම, පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් සහ උක් වගාව කෘෂිකාර්මික කටයුතුවල සමස්ත වර්ධනයට හිතකර දායකත්වයක් ලබා දී ඇත. කෙසේ වුවද, එළවළු වගාව, වන වගාව, ධාන්‍ය වගාව, කුළුබඩු භෝග වගාව, ධීවර කටයුතු සහ තේ වගාව මෙම කාලසීමාවේ දී පහත වැටුණි.

## නිෂ්පාදන ප්‍රවණතා සහ ආයතනික සහාය: කෘෂිකර්මය

### කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය

- **කෘෂිකාර්මික හා ධීවර කටයුතුවල නිමැවුම මනිනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය 2019 පළමු භාගයේ දී සියයට 1.6 ක වර්ධනයක් වාර්තා කළේය.** ප්‍රධාන වශයෙන් 2018/19 මහ කන්නයේදී පැවති හිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් වී උප අංශය සියයට 28.2 ක වර්ධනයක් වාර්තා කළේය. පොල් හා රබර් උප අංශ විසින්, පිළිවෙළින් සියයට 29.3 ක හා සියයට 4.0 ක වර්ධනයක් වාර්තා කරමින් සමස්ත කෘෂිකාර්මික නිමැවුම සඳහා ධනාත්මක දායකත්වයක් සපයන ලදී. මේ අතර, තේ උප අංශය සියයට 0.2 කින් සුළු වශයෙන් වර්ධනය විය. වසරේ පළමු කාර්තුවේ දී පැවති වියළි කාලගුණික තත්ත්වය හා වතු අංශයේ වැටුප් වැඩි කිරීම පිළිබඳව සාකච්ඡාවන් අතරතුර පැන නැගුණු සේවක ගැටලු හේතුවෙන් තේ උප අංශයේ වර්ධනය පහළ ගියේය. 2018 වසරේ පළමු භාගය හා සැසඳීමේදී ධීවර උප අංශය බොහෝ දුරට නොවෙනස් තත්ත්වයක පැවතුණි.

**2.1 සංඛ්‍යා සටහන**

**කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශකය (2007 - 2010 = 100)**

| අයිතමය | 2018 පළමු භාගය (අ) | 2019 පළමු භාගය (ආ) | වර්ධන වේගය (%) 2017/18 (අ) | වර්ධන වේගය (%) 2018/19 (ආ) |
|---|---|---|---|---|
| **කෘෂිකාර්මික සහ මත්ස්‍ය** | **135.5** | **137.7** | **14.8** | **1.6** |
| **1. කෘෂිකර්මය** | **132.1** | **134.7** | **18.8** | **2.0** |
| **1.1 කෘෂිකාර්මික භෝග** | **124.4** | **127.1** | **19.9** | **2.2** |
| වී | 128.2 | 164.3 | 62.6 | 28.2 |
| තේ | 101.1 | 101.3 | 1.3 | 0.2 |
| රබර් | 59.9 | 62.2 | -10.9 | 4.0 |
| පොල් | 86.0 | 111.2 | -5.5 | 29.3 |
| අනෙකුත් භෝග | 168.6 | 135.4 | 22.4 | -19.7 |
| එයින්, එළවළු | 170.4 | 139.5 | 30.5 | -18.1 |
| පලතුරු | 183.9 | 133.1 | 12.1 | -27.6 |
| වෙනත් ක්ෂේත්‍ර භෝග | 176.2 | 151.3 | 29.1 | -14.2 |
| **1.2 පශු සම්පත්** | **192.6** | **195.0** | **13.0** | **1.2** |
| **2. මත්ස්‍ය** | **152.5** | **152.5** | **0.6** | **0.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### වී

- **ලැබී ඇති තොරතුරු අනුව, 2018 වසරේ මෙට්‍රික් ටොන් මිලියන 3.9 ක් වූ වී නිෂ්පාදනයට සාපේක්ෂව, 2019 වසරේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.6 ක් දක්වා සියයට 17.4 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය.** වසර තුළ දී වී නිෂ්පාදනයේ එම ඉහළ යෑම, 2018/19 මහ කන්නයේ නිෂ්පාදනය සියයට 28.2 කින් ඉහළ යෑම හා 2019 යල කන්නයේ නිෂ්පාදනයේ සියයට 0.5 ක අපේක්ෂිත වර්ධනයේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් වනු ඇත. ඒ අනුව, 2018/19 මහ කන්නයේ හා 2019 යල කන්නයේ නිෂ්පාදනය පිළිවෙළින් මෙට්‍රික් ටොන් මිලියන 3.1 ක් හා මෙට්‍රික් ටොන් මිලියන 1.5 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. පැවති යහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඵලදාව ඉහළ යෑම සහ වගා කළ හා අස්වනු නෙළා ගත් බිම් ප්‍රමාණය ඉහළ යෑම, සමස්ත වාර්ෂික නිෂ්පාදනයෙන් සියයට 67 කට පමණ දායකත්වය දැක්වූ 2018/19 මහ කන්නයේ වාර්තා වූ ඉහළ අස්වැන්න සඳහා හේතු විය.

**2.2 රූප සටහන**

**වී නිෂ්පාදනය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මේ අතර, වී සඳහා සහතික මිලක් ලබා දීමේ වැඩසටහන මගින් සාමාන්‍යයෙන් වගා නොකෙරෙන බිම් ද වගාවට යොදා ගැනීම සඳහා ගොවීන් යොමු වීම දිරිමත් කරන ලදී. පෙර වසරේ මහ කන්නය හා සැසඳීමේ දී 2018/19 මහ කන්නයේ වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 12.1 කින් ඉහළ ගිය අතර අස්වනු නෙළා ගන්නා ලද බිම් ප්‍රමාණය සියයට 16.2 කින් ඉහළ ගියේය. මේ අතර, වී අලෙවි මණ්ඩලය විසින් 2017/18 මහ කන්නයේදී මිලදී ගත් වී මෙට්‍රික් ටොන් 4,605 ට සාපේක්ෂව 2018/19 මහ කන්නයේ දී වී මෙට්‍රික් ටොන් 50,000 ක පමණ ප්‍රමාණයක් මිලදී ගන්නා ලදී. ඇස්තමේන්තුගත වාර්ෂික වී නිෂ්පාදනය මගින් සහල් මෙට්‍රික් ටොන් මිලියන 2.9 ක් නිපදවීමට හැකි වනු ඇති අතර, එය මාස 15 ක පමණ දේශීය ගෘහස්ථ ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් වනු ඇත. මේ අතර 2018 වසරේ පළමු භාගයේ දී ආනයනික සහල් මෙට්‍රික් ටොන් 239,519 ට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගය තුළ දී සහල් මෙට්‍රික් ටොන් 11,066 ක් පමණක් ආනයනය කරන ලදී. අදාළ කාලපරිච්ඡේදය තුළ දී පොහොර සහනාධාර වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක වූ අතර, ඒ යටතේ වී ගොවීන් 930,481 දෙනෙකු වෙත පොහොර මෙට්‍රික් ටොන් 197,000 ක් පමණ බෙදා දෙන ලදී. තවද, වී වගා කටයුතුවල දී සිදුවන හානි අවම කිරීම මගින් ඵලදායීතාව ඉහළ නැංවීම මෙන්ම බීජ වී අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා බීජ නිෂ්පාදනයට ගොවීන් යොමු කිරීමේ අරමුණ ඇතිව ගොවීන්ට සහනාධාර මිලක් යටතේ බීජ හා පැරෂුට් තැටි ලබා දීම ද සිදු කරන ලදී.

- **2018/19 මහ කන්නයේ අස්වැන්න ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස විවෘත වෙළෙඳපොළේ වී මිල ගණන් පහළ යෑම සිදු වූ අතර එමගින් සහල් සිල්ලර මිල ගණන් ද පහළ ගියේය.** 2019 වසරේ පළමු භාගය තුළ දී විවෘත වෙළඳපොළෙහි සම්බා වී කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව, රුපියල් 39.20 ක් දක්වා සියයට 23.7 කින් පහළ ගිය අතර, නාඩු වී කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල 2018 පළමු භාගය හා සැසඳීමේ දී රුපියල් 38.21 දක්වා සියයට 4.6 කින් පහළ ගියේය. මේ අතර, වසරේ පළමු භාගයේ දී සම්බා සහල් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රුපියල් 106.25 ක් ලෙස වාර්තා වූ අතර එය පෙර වසර හා සැසඳීමේ දී සියයට 1.0 කින් පහළ යෑමකි. නාඩු සහල් කිලෝග්‍රෑමයක සාමාන්‍ය සිල්ලර මිල රුපියල් 90.90 ක් දක්වා පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 2.5 කින් පහළ ගියේය.

### තේ

- **2019 වසරේ පළමු භාගය තුළ දී තේ නිෂ්පාදනය, 2018 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ කිලෝග්‍රෑම් මිලියන 158.2 හා සැසඳීමේ දී, කිලෝග්‍රෑම් මිලියන 158.5 ක් දක්වා සියයට 0.2 කින් සුළු වශයෙන් ඉහළ ගියේය.** මෙය, ප්‍රධාන වශයෙන් තේ වගා කරන ප්‍රදේශ ආශ්‍රිතව ඇති වූ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් 2019 වසරේ පළමු කාර්තුවේ දී සියයට 1.2 කින් නිෂ්පාදනය පහළ යෑම හා යහපත් කාලගුණික තත්ත්වයන්ගේ බලපෑමෙන් 2019 වසරේ දෙවන කාර්තුවේ දී නිෂ්පාදනය සියයට 1.4 කින් ඉහළ යෑමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 22 කට පමණ දායකත්වයක් සපයන උඩරට තේ නිෂ්පාදනය 2019 වසරේ පළමු භාගය තුළ දී සියයට 4.4 කින් පහළ ගියේය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් මැදරට හා පහතරට තේ වගා ප්‍රදේශයන්හි පැවති හිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන්, සමස්ත නිෂ්පාදනයෙන් සියයට 78.2 කට දායකත්වයක් ලබා දෙන මැදරට හා පහතරට තේ නිෂ්පාදනය, පිළිවෙළින් සියයට 4.3 කින් හා සියයට 0.9 කින් වර්ධනය විය. මේ අතර, 2019 වසරේ පළමු මාස අට තුළ දී තේ නිෂ්පාදනය පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, කිලෝග්‍රෑම් මිලියන 209.2 ක් දක්වා සියයට 3.2 කින් වර්ධනය විය. ශ්‍රී ලංකා තේ මණ්ඩලය (ශ්‍රී.ලං.තේ.ම.) මගින් සිය තේ කර්මාන්තශාලා නවීකරණ සහනාධාර වැඩසටහන සහ අක්කර දහයට වැඩි තේ වතු සඳහා වූ තේ නැවත සිටුවීමේ සහනාධාර ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. පසු අස්වනු හානිය අවම කිරීම හා හොඳම තේ දලු ප්‍රමිතීන් ඉහළ නැංවීම ඉලක්ක

**2.3 රූප සටහන**
**තේ නිෂ්පාදනය**




මූලය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

කර ගනිමින් ‘Best Leaf 60’ වැඩසටහන 2019 වසරේ පළමු භාගයේ දී තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, ශ්‍රී.ලං.තේ.ම. මගින් කසල තේ අලෙවිය හා සීනි මිශ්‍රිත තේ නිෂ්පාදනය වැනි ක්ෂේත්‍ර මට්ටමේ පවතින අවභාවිතා අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම තවදුරටත් සිදු කරන ලදී.

- **2019 වසරේ පළමු භාගයේ දී කොළඹ තේ වෙන්දේසියේ තේ මිල ගණන් තවදුරටත් පහළ ගියේය.** 2019 වසරේ පළමු භාගයේ දී සාමාන්‍ය තේ මිල ගණන්, 2018 වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, කිලෝග්‍රෑමයකට රුපියල් 560.73 ක් දක්වා සියයට 7.3 කින් පහළ ගියේය. කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය මිල ගණන්හි ලක්ෂ්‍යමය පදනම මත වැඩිම මිල පහළ යෑම මැදරට තේ (සියයට 10.4 කින්) වාර්තා කළ අතර එයට පසුව උඩරට තේ සියයට 8.1 කින් හා පහතරට තේ සියයට 6.3 කින් පහළ ගියේය. කොළඹ තේ වෙන්දේසිය සඳහා ඉහළ තොග ලැබීම හා විකුණුම්කරුවන් සාම්ප්‍රදායික කළු තේ සැපයීමට විශේෂ අවධානයක් යොමු කරන තත්ත්වයක මහා පරිමාණ ගැණුම්කරුවන් CTC තේ වැනි විකල්ප ප්‍රභේද වෙත යොමු වීම හේතුවෙන් සාම්ප්‍රදායික කළු තේ සඳහා සාපේක්ෂව අඩු ඉල්ලුමක් පැවතීම මෙම සැලකිය යුතු මිල පහළ යෑමට හේතු විය. තේ මිල ගණන්හි අඛණ්ඩ මිල පහළ යෑමට සමගාමීව, කුඩා තේ වතු හිමියන්ට තේ දලු සඳහා ලැබුණු සාමාන්‍ය මිල, 2018 වසරේ පළමු භාගයේ පැවති කිලෝග්‍රෑමයකට රුපියල් 88.63 ක සිට 2019 වසරේ පළමු භාගයේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 81.92 ක් දක්වා පහළ ගියේය. මේ අතර, තේ අපනයන මත පනවන ලද බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 3.50 සිට රුපියල් 3.00 දක්වා අඩු කිරීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

2

## රබර්

- **බොහෝ දුරට පැවති හිතකර කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම හේතුවෙන් 2019 වසරේ පළමු භාගය තුළ රබර් නිෂ්පාදනය පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී කිලෝග්‍රෑම් මිලියන 41.8 ක් දක්වා සියයට 4.0 කින් ඉහළ ගියේය.** 2019 වසරේ පළමු භාගය තුළ දී, ක්‍රේප් රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 9,128.3 ක් දක්වා සියයට 32.9 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ෂීට් රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 20,878.6 ක් දක්වා සියයට 4.0 කින් ඉහළ ගියේය. මේ අතර, සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 28.1 කට පමණ දායකත්වයක් සපයන අනෙකුත් කාණ්ඩවල රබර් නිෂ්පාදනය 2019 වසරේ පළමු භාගය තුළ දී මෙට්‍රික් ටොන් 11,750.3 ක් දක්වා සියයට 11.1 කින් පහළ ගියේය. තවද, 2019 වසරේ පළමු මාස අට තුළ සමස්ත රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 53.3 ක් දක්වා සියයට 0.3 කින් සුළු වශයෙන් පහළ ගියේය. වසර 2018 දී මෙට්‍රික් ටොන් 82,560 ක් වූ වාර්ෂික රබර් නිෂ්පාදනය වසර 2040 දී මෙට්‍රික් ටොන් 200,000 ක් දක්වා ඉහළ නැංවීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිය ක්‍රමෝපායික සැලැස්ම ක්‍රියාවට නංවන ලදී. 2019 වසරේ අයවැය යෝජනාවකට හා කැබිනට් තීරණයකට අනුව රබර් නැවත වගාව සඳහා ලබා දෙන දීමනාව දෙගුණ කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, 2019 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රබර් නැවත වගාව හා නව වගාව සඳහා වන සහනාධාර දීමනාව, පිළිවෙළින් හෙක්ටයාරයකට රුපියල් 350,000 හා හෙක්ටයාරයකට රුපියල් 300,000 ක් ලෙස ඉහළ නංවන ලදී.

- **2019 වසරේ පළමු භාගයේදී ගෝලීය හා දේශීය වෙළඳපොළ ස්වාභාවික රබර් සඳහා වූ සාමාන්‍ය මිල ගණන් පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී පහළ මට්ටමක පැවතිණි.** ඇමෙරිකා එක්සත් ජනපදය හා චීනය අතර පවතින වෙළඳ අර්බුදය හේතුවෙන් ගෝලීය ඉල්ලුම මන්දගාමී වීම

නිසා ගෝලීය වෙළඳපොළෙහි ස්වභාවික රබර් මිල ගණන් පහළ ගියේය. මේ අතර, සලකනු ලබන කාලපරිච්ඡේදය තුළ දී කොළඹ රබර් වෙන්දේසියේ නොම්මර 1 දුම් ගැසූ දාර සහිත ෂීට් රබර්වල (RSS 1) සාමාන්‍ය මිල කිලෝග්‍රෑමයට රුපියල් 270.80 ක් දක්වා සියයට 6.5 කින් පහළ ගිය අතර ලේටෙක්ස් ක්‍රේප් රබර් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල කිලෝග්‍රෑමයට රුපියල් 266.13 ක් දක්වා සියයට 18.3 කින් පහළ ගියේය.

### පොල්

- **2019 වසරේ පළමු භාගයේ දී පොල් නිෂ්පාදනය, 2018 වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී ගෙඩි මිලියන 1,575 ක් දක්වා සියයට 29.3 කින් ඉහළ ගියේය.** 2018 වසරේ අවසන් කාර්තුවේ දී ප්‍රධාන පොල් වගා ප්‍රදේශ ආශ්‍රිතව පැවති යහපත් කාලගුණික තත්ත්වයන්ගේ පසු බලපෑම පොල් නිෂ්පාදනය ඉහළ යෑමට මූලික වශයෙන් දායක විය. ඒ අනුව, දිසිඳි පොල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 22,023 ක් දක්වා සියයට 160.3 කින් ඉහළ ගියේය. මේ අතර, 2019 වසරේ පළමු භාගයේ දී පොල්තෙල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 25,852 ක් දක්වා සියයට 806.8 කින් ඉහළ ගියේය. එමෙන්ම, 2018 වසරේදී කර්මාන්තශාලා තාවකාලිකව වසා තැබීම හේතුවෙන් උපරිම ධාරිතාවයෙන් ක්‍රියාකාරී නොවූ නොඉඳුල් පොල් තෙල් (Virgin Coconut Oil) නිෂ්පාදනය, 2019 වසරේ පළමු භාගයේ දී මෙට්‍රික් ටොන් 6,725 ක් දක්වා සියයට 16.2 කින් ඉහළ ගියේය. තවද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේ දී පොල් ක්‍රීම්, පිටි කළ පොල් කිරි හා දියර පොල් කිරි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 31,930 ක් දක්වා සියයට 3.0 කින් පහළ ගියේය. මේ අතර, 2019 වසරේ පළමු මාස අට තුළ දී පොල් නිෂ්පාදනය 2018 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ ගෙඩි මිලියන 1,679.3 හා සැසඳීමේ දී ගෙඩි මිලියන 2,105.8 ක් දක්වා සියයට 25.4 කින් ඉහළ ගියේය. 2019 වසරේ පළමු භාගය තුළ දී පොල් සංවර්ධන අධිකාරිය විසින් උපකරණ ලබා දීම, යන්ත්‍රෝපකරණ හා මෙවලම් ලබා දීම, ව්‍යාපාර හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම්වත් කිරීම සහ තාක්ෂණික හුවමාරු වැඩසටහන් පැවැත්වීම මගින් කුඩා පරිමාණ හා අසංවිධිත පොල් කර්මාන්ත අංශය වෙත අඛණ්ඩව සහයෝගය ලබා දෙන ලදී.

- **කර්මාන්ත අංශය තුළ පොල් ගෙඩි සඳහා ඉහළ ඉල්ලුමක් පැවතිය ද, 2019 වසරේ පළමු භාගය තුළ දී පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ මිල ගණන්, පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, අඩු මට්ටමක පැවතුණි.** 2019 වසරේ පළමු භාගයේ දී පොල් ගෙඩියක සාමාන්‍ය සිල්ලර මිල, පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රුපියල් 77.61 හා සැසඳීමේ දී රුපියල් 51.60 ක් ලෙස පැවතුණි. මේ අතර, දේශීය පොල්තෙල් නිෂ්පාදනය වැඩි වීම හා පාම් තෙල් ආනයන ඉහළ යෑම හේතුවෙන් පෙර වසරේ පළමු භාගයේ දී රුපියල් 288.56 ක් ව පැවති මිලි ලීටර 750 ක පොල් තෙල් බෝතලයක සාමාන්‍ය මිල 2019 වසරේ පළමු භාගයේ දී රුපියල් 262.58 ක් දක්වා පහළ ගියේය. තවද, කොළඹ පොල් වෙන්දේසියේ දිසිඳි පොල් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල 2018 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ රුපියල් 476.30 ක සිට 2019 වසරේ පළමු භාගයේ දී රුපියල් 250.08 දක්වා සියයට 47.5 කින් පහත වැටුණි. ජාත්‍යන්තර වෙළඳපොළෙහි දිසිඳි පොල්වල සාමාන්‍ය මිල ගණන් පෙර වසරේ පළමු භාගයේ දී පැවති කිලෝග්‍රෑමයකට රුපියල් 534.45 ක සිට 2019 වසරේ පළමු භාගයේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 275.24 ක් දක්වා පහත වැටුණි.

### වෙනත් ක්ෂේත්‍ර භෝග

- **2019 වසරේ මුල් මාස කිහිපයේ පැවති අහිතකර කාලගුණික තත්ත්ව හා 'සේනා' දළඹු වසංගත තත්ත්වය නිසා ඇති වූ වගා හානි හේතුවෙන් 2018/2019 මහ කන්නයේ දී වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 369,488 ක් දක්වා සියයට 13.9 කින් පහළ ගියේය.** ප්‍රධාන වශයෙන්ම වගා හානි හේතුවෙන් 2018/19 මහ කන්නයේ දී ලොකු ළූණු, මිරිස්, කව්පි, මුං ඇට, කුරක්කන් හා අර්තාපල් වැනි භෝග නිෂ්පාදනය පහළ ගියේය. සේනා දළඹු බලපෑම හේතුවෙන් ඇති වූ මෙට්‍රික් ටොන් 75,000 ක පමණ ඇස්තමේන්තුගත දැඩි වගා හානි හේතුවෙන් 2018/19 මහ කන්නයේ බඩ ඉරිඟු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 220,425 ක් දක්වා සියයට 9.3 කින් පහළ ගියේය. තවද, රටකජු, කව්පි සහ මුං ඇට යන භෝගයන්ගේ ද වගා හානි වාර්තා විය. කෙසේ වෙතත්, 2019 යල කන්නයේ දී වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සේනා දළඹු උවදුර පාලනය කිරීම පිළිබඳව ගොවීන් අතර දැනුම්වත්භාවය ඉහළ නංවමින්, සේනා දළඹු උවදුර මර්ධනය සඳහා පියවර රැසක් ක්‍රියාවට නංවන ලදී.

### එළවළු

- **2018/19 මහ කන්නයේ දී එළවළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 835,741 ක් දක්වා සියයට 15.2 කින් පහළ ගියේය.** කෙසේ වෙතත්, 2019 වසරේ පළමු භාගයේ දී දිස්ත්‍රික්ක රැසක පැවති වියළි කාලගුණික තත්ත්වය හා සේනා දළඹු වසංගතය හේතුවෙන් ඇති වූ වගා හානි මධ්‍යයේ වුවද වෙළඳපොළ වෙත එළවළු සැපයුම යහපත් තත්ත්වයක පැවතීම හේතුවෙන් වසරේ මුල් භාගයේ දී එළවළු මිල ගණන් සාපේක්ෂව පහළ මට්ටමක පවත්වාගත හැකි විය. නමුත්, 2018/19 මහ කන්නයේ අඩු වූ අස්වැන්න සැපයුම මාර්තු හා අප්‍රේල් මාසවල දී ද පැවතීම හේතුවෙන් උත්සව සමයේ එළවළු මිල ගණන් ඉහළ යැමේ පීඩනයක් ඇති විය. 2019 වසරේ දෙවන කාර්තුව අග භාගයේ දී නිරීක්ෂණය වූ උඩරට හා පහතරට එළවළුවල මිල පහළ යාමේ ප්‍රවණතාව, 2019 වසරේ තුන්වන කාර්තුව ආරම්භයේ සිට විශේෂයෙන්ම වැසි සහිත කාලගුණික තත්ත්ව හේතුවෙන් වෙළඳපොළ සැපයුම සීමිත වීම නිසා මිල වැඩි වීමක් දක්නට ලැබුණි.

- **ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය අනුව යමින්, කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන විසින් කෘෂිකාර්මික ඵලදායීතාව ඉහළ නැංවීම සහ කෘෂිකර්මාන්තය සඳහා වූ වැඩිදියුණු කළ තාක්ෂණික භාවිතයන් ප්‍රචලිත කිරීම සඳහා පියවර රැසක් ගන්නා ලදී.** ඒ අනුව, පළිබෝධකයන් කල් තියා හඳුනා ගැනීම හා පාලන ක්‍රම පිළිබඳව ගොවීන් හා ව්‍යාප්ති නිලධාරීන් අතර දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කෙරුණි. තවද, බඩ ඉරිඟු, ලොකු ළූණු, මුං ඇට සහ කව්පි වැනි අනෙකුත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පාර්ශ්වකරුවන් අතර යහපත් කෘෂිකාර්මික පුරුදු ප්‍රවර්ධනය කරමින් සහතික කළ බීජ හා බිංදු ජල සම්පාදනය ගොවීන් අතර ප්‍රචලිත කිරීම සිදු කරන ලදී.

### සීනි

- **2019 වසරේ පළමු භාගයේ දී සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 24,233 ක් දක්වා සියයට 95.8 කින් ඉහළ ගියේය.** මූලික වශයෙන් පැවති යහපත් කාලගුණික තත්ත්ව සහ උක් වගා සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීමෙන් හා වගා බිම් ප්‍රමාණය ඉහළ යැම නිසා උක් සැපයුම ඉහළ යැම හේතුවෙන් සී/ස ලංකා සීනි (පෞද්.) සමාගම යටතේ ක්‍රියාත්මක වන සෙවනගල හා පැල්වත්ත ඒකක හා සී/ස. ගල්ඔය (හිඟුරාන) සීනි කර්මාන්තායතනයේ නිෂ්පාදනයේ සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. ඒ අනුව, සෙවනගල හා පැල්වත්ත සීනි කර්මාන්තශාලාවල නිෂ්පාදනය, පිළිවෙළින් සියයට 60.4 කින් හා සියයට 70.8 කින් ඉහළ ගිය අතර ගල්ඔය කර්මාන්ත ශාලාවේ සීනි නිෂ්පාදනය සියයට 293.9 කින් ඉහළ ගියේය. 2019 වසරේදී සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 65,690 ක් දක්වා සියයට 28.5 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය දේශීය සීනි අවශ්‍යතාවයෙන් සියයට 11 කට පමණ සමාන වනු ඇත. මේ අතර, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් සීනි කර්මාන්තය ඉහළ නැංවීම සඳහා පියවර ගන්නා ලද අතර, උක් පර්යේෂණ ආයතනය විසින් පොහොර යෙදීම, පළිබෝධ හා රෝග කළමනාකරණය සහ හායනයට ලක් වූ පස වැඩිදියුණු කිරීම ඇතුළුව භෝග කළමනාකරණය පිළිබඳව අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙමින් සිය සේවා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

### පශු සම්පත්

- **2019 වසරේ පළමු භාගයේ දී සමස්ත කිරි නිෂ්පාදනය, පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී ලීටර මිලියන 253.9 ක් දක්වා සියයට 6.0 කින් වර්ධනය විය.** පශු සම්පත් අංශයේ ප්‍රධාන සැලැස්ම යටතේ කිරි ගවයින් පාලනය කිරීමේ යහ පුරුදු ප්‍රචලිත කිරීම එම වර්ධනයට හේතු විය. මේ අතර, ගවයන්ට ලබා දෙන සාන්ද්‍රගත ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යෑමෙන් කිරි ලීටරයක සාමාන්‍ය නිෂ්පාදන මිල වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස දියර කිරිවල සාමාන්‍ය ගොවිපළ මිල ගණන් ඉහළ ගියේය. 2019 වසරේ දී කිරි නිෂ්පාදනය ලීටර මිලියන 517 ක් දක්වා සියයට 10 කින් පමණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂිත අතර එය සමස්ත ගෘහස්ත අවශ්‍යතාවයෙන් සියයට 43 ක් පමණ සැපිරීමට ප්‍රමාණවත් වනු ඇත. 2019 වසරේ පළමු භාගය තුළ දී කුකුල් මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 111,480 ක් දක්වා සියයට 9.8 කින් ඉහළ ගියේය. තවද, 2019 වසරේ පළමු භාගයේ දී බ්‍රොයිලර් මාපිය සතුන් (Broiler Parent) නිපදවීම සියයට 24 කින් පමණ ඉහළ යෑම ද කුකුළු මස් නිෂ්පාදනයේ වර්ධනයට විශාල ලෙස දායක විය. මේ අතර, පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරය නිසා හෝටල් අංශය වෙතින් අඩු ඉල්ලුමක් පැවතීම හේතුවෙන් බිත්තර නිෂ්පාදනය මිලියන 1,324 ක් දක්වා සියයට 14.1 කින් පහළ ගියේය.

2

## ධීවර

- **2019 වසරේ පළමු භාගයේ දී මත්ස්‍ය නිෂ්පාදනය, 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී කිලෝග්‍රෑම් මිලියන 254.5 ක් දක්වා සියයට 0.03 කින් සුළු වශයෙන් වර්ධනය විය.** ප්‍රධාන වශයෙන් කාලගුණය නිසා මතු වූ බාධා හේතුවෙන් වෙරළාශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 119,250 ක් දක්වා සියයට 0.1 කින් සුළු වශයෙන් පහළ ගියේය. මේ අතර, සමස්ත මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය ද සියයට 3.5 කින් පහළ ගියේය. මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය පහළ යෑමට මූලික වශයෙන් හේතු වූයේ වසරේ පළමු භාගය තුළ දී ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 93,690 ක් දක්වා සියයට 7.4 කින් පහළ යෑමය. කෙසේ වෙතත්, ඉස්සන් වගා කිරීම අංශයේ නිෂ්පාදනය සියයට 11.5 කින් පහළ ගිය ද, මිරිදිය ජලාශවල මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවී වගා අංශයේ නිෂ්පාදනය, පිළිවෙළින් සියයට 28.5 කින් හා සියයට 18.1 කින් ඉහළ ගියේය. 2019 වසරේ මුල් කාලයේ දී පැවැති වියළි කාලගුණික තත්ත්ව හේතුවෙන් ප්‍රධාන ජලාශවල ජල මට්ටම් පහළ මට්ටමක පැවතීම නිසා දැල් එළිය හැකි වපසරිය වැඩි වීම හේතුවෙන් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, 2018 වර්ෂයේ දී ජලාශයන්ට මත්ස්‍ය පැටවුන් මුදා හැරීම ඉහළ යෑම ද මෙම නිෂ්පාදනයේ වර්ධනයට දායක විය. තවද, 2019 වසරේ පළමු මාස අට තුළ දී සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 336,420 ක් දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් පහළ ගියේය. මිරිදිය හා ජලජීවී වගා අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීමේ දැක්ම ඇතිව ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය විසින් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා සම්බන්ධව මත්ස්‍ය පැටවුන් හා මිරිදිය ඉස්සන් පැටවුන් තැන්පත් කිරීම ඉහළ නැංවීම, ප්‍රජා සහභාගිත්වය ඇතිව ජල මූලාශ්‍ර මනා ලෙස කළමනාකරණය හා ප්‍රජා පාදක කුඩා අභිජනනාගාර ඉදිකිරීම ඇතුළු පියවර රැසක් ගන්නා ලදී. සලකනු ලබන කාලපරිච්ඡේදය තුළදී ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ජලාශ 20 ක් ප්‍රතිසංස්කරණය කරන ලද අතර තෙත් කලාපයේ ජලාශයන්හි ජලජීවී වගාව සංවර්ධනය කිරීම සඳහා වූ විශේෂ ව්‍යාපෘතියක් යටතේ මත්ස්‍ය පැටවුන් 220,750 ක් සහ මිරිදිය ඉස්සන් පැටවුන් 118,000 ක් මුදා හැරීමට පියවර ගන්නා ලදී.

## කර්මාන්ත

- **2019 වසරේ පළමු භාගයේ දී කර්මාන්ත කටයුතු, 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ සියයට 2.2 ක වර්ධනයට සාපේක්ෂව, සියයට 2.3 කින් වර්ධනය විය.** ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතුවල දක්නට ලැබුණු හිතකර වර්ධනය කර්මාන්ත කටයුතුවල වර්ධනයට මූලිකවම දායකත්වය දක්වන ලදී. කෙසේ වුව ද, වසරේ පළමු භාගයේ දී නිෂ්පාදන කර්මාන්ත කටයුතු සාපේක්ෂව අඩු වර්ධන වේගයක් වාර්තා කරන ලදී. අනෙකුත් කර්මාන්ත කටයුතු සැලකීමේ දී, විදුලිය, ගෑස්, වාෂ්ප හා වායුසමීකරණ සැපයුම් ක්‍රියාකාරකම්, මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය හා එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ ක්‍රියාකාරකම් සහ ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම හා බෙදාහැරීමේ ක්‍රියාකාරකම් ද මෙම කාලයේ දී කර්මාන්ත කටයුතුවල සමස්ත වර්ධනයට හිතකර ලෙස දායක විය.

- **ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතුවල දක්නට ලැබුණු හිතකර වර්ධනය, 2019 වසරේ පළමු භාගයේ දී කර්මාන්ත කටයුතු වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් දායක විය.** ඒ අනුව, ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතු 2018 වසරේ පළමු භාගයේ දී පිළිවෙළින් වාර්තා කළ සියයට 0.8 ක හා සියයට 1.2 ක අඩු වීමට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී පිළිවෙළින්, සියයට 4.7 ක හා සියයට 2.8 ක වර්ධනයක් වාර්තා කරන ලදී. ඉදිකිරීම් කටයුතුවල සිදු වූ මෙම වර්ධනය, 2018 වසරේ පළමු භාගය තුළ දී සියයට 0.7 ක පහළ යාමක් පෙන්නුම් කළ සිමෙන්ති උපයෝජ්‍යතාව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 3.9 ක ඉහළ වර්ධනයක් වාර්තා කිරීම තුළින් පිළිබිඹු විය. මේ අතර, නිෂ්පාදන කර්මාන්ත කටයුතු 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 0.9 ක අඩු වේගයකින් වර්ධනය විය. මෙම අඩු වර්ධනය කෙරෙහි 2018 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගය තුළ දී, ගෘහ භාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදනවල දක්නට ලැබුණු පහත වැටීම මෙන්ම, ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු සාපේක්ෂ අඩු වර්ධනය ද හේතු විය. මේ අතර, අඟුරු හා පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන, රෙදිපිළි, නිමි ඇඳුම් හා සම් භාණ්ඩ නිෂ්පාදනය, ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සහ ලෝහමය නොවන වෙනත් ඛනිජ

නිෂ්පාදනවල වර්ධනය නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ත වර්ධනය කෙරෙහි ධනාත්මකව බලපෑවේය. කර්මාන්ත ආශ්‍රිත වෙනත් කටයුතු සැලකීමේ දී, විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීමේ කටයුතු, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 5.8 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 3.8 කින් වර්ධනය විය. තවද, ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීමේ කටයුතු සහ මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය 2018 වසරේ පළමු භාගයේ දී, පිළිවෙළින් වාර්තා කළ සියයට 2.5 ක හා සියයට 6.3 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී, පිළිවෙළින් සියයට 6.9 කින් සහ සියයට 8.7 කින් වර්ධනය විය.

## නිෂ්පාදන ප්‍රවණතා සහ ආයතනික සහාය: නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම්

### කාර්මික නිෂ්පාදන දර්ශකය

- **ප්‍රධාන උප අංශවල නිෂ්පාදනය ඉහළ යාමත් සමගම 2019 වසරේ පළමු භාගයේ දී නිෂ්පාදන අංශය සුළු වර්ධනයක් වාර්තා කළේය.** කාර්මික නිෂ්පාදන දර්ශකයට අනුව, පසුගිය වසරේ අනුරූප භාගයේ දී වාර්තා කළ සියයට 1.0 ක වර්ධනයට සාපේක්ෂව නිෂ්පාදන අංශය 2019 වසරේ පළමු භාගයේ දී සියයට 1.4 ක වර්ධනයක් වාර්තා කළේය. සලකා බලන කාලපරිච්ඡේදයේ දී, රෙදි නිෂ්පාදනය, ඇඟලුම් නිෂ්පාදනය, බීම වර්ග, අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදන, රසායනික හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන, රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය සහ වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය ආදී වූ කාර්මික නිෂ්පාදන දර්ශකයට අයත් වූ සමහර උප අංශ වර්ධනයක් පෙන්නුම් කළ අතර, ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය, දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය, ගෘහ භාණ්ඩ හැර අනෙකුත් දැව නිෂ්පාදන, මූලික ලෝහ වර්ග හා පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන යන අංශ මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කළේය.

- **කාර්මික නිෂ්පාදන දර්ශකයේ විශාලතම උප අංශය වන ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන කාණ්ඩයට පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරයෙන් යම් තරමක බලපෑමක් සිදු වූ අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ වර්ධනයට සාපේක්ෂව, 2019 වසරේ පළමු භාගයේ දී මෙම අංශයේ මන්දගාමී වීමක් වාර්තා විය.**

**2.4 රූප සටහන**

**කාර්මික නිෂ්පාදන දර්ශකය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය මාර්තු හා මැයි මාස හැර අනෙකුත් සියලුම මාසවල දී පසුබෑමක් වාර්තා කළේය. සමස්තයක් ලෙස මෙම උප අංශය, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 2.8 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 2.8 ක ඍණ වර්ධනයක් වාර්තා කළේය. අඩු මට්ටමක පැවති ඉල්ලුම හේතුවෙන් ටින් මාළු, කුකුළු මස් නිෂ්පාදන, කිරි පිටි, තිරිඟු පිටි හා අයිස්ක්‍රීම් ආදී වූ අයිතමවල නිෂ්පාදනය අඩුවීම ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන අංශය මන්දගාමී වීමට හේතු විය.

- **ප්‍රධාන සාම්ප්‍රදායික අපනයන වෙළඳපොළවල මන්දගාමී වර්ධනයක් පැවතිය ද ඇඟලුම් හා රෙදි අපනයන කර්මාන්ත ස්ථාවරව පැවැතියේය.** කාර්මික නිෂ්පාදන දර්ශකයේ පහෙන් එකකට පමණ ප්‍රමාණයකට දායකත්වයක් දක්වන ඇඟලුම් නිෂ්පාදන අංශය, පසුගිය වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.9 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 2.8 ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, 2018 වසරේ පළමු භාගයේ දී මන්දගාමී වීමක් පෙන්නුම් කළ රෙදි නිෂ්පාදනය, අපනයන ආදායම ඉහළ යෑමෙන් පිළිබිඹු වන ශක්තිමත් විදේශ ඉල්ලුම හමුවේ 2019 වසරේ පළමු භාගයේ දී වර්ධනයක් වාර්තා කළේය. රෙදි නිෂ්පාදන අංශයේ ධනාත්මක වර්ධනය සඳහා මුද්‍රණය කරන ලද රෙදි නිෂ්පාදනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් බලපෑවේය.

- **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත මගින් මුළුමනින්ම සමන්විත අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනය 2019 වසරේ පළමු භාගයේ දී ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය.** සපුගස්කන්ද

තෙල් පිරිපහදුවේ කාර්යක්ෂමතාව, විශ්වසනීය ක්‍රියාකාරිත්වය සහ ඵලදායීතාව ඉහළ නැංවීම අරමුණු කරගෙන ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2018 වසරේ පළමු කාර්තුවේ දී තෙල් පිරිපහදුවේ ක්‍රියාවලි බලාගාරය, උපයෝගීතා අංශය සහ ටැංකි පරිශ්‍රය යන ප්‍රධාන අංශ තුන අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එහි ධාරිතා උපයෝජනය ඉහළ ගියේය. ඒ අනුව, පෙට්‍රල්, සුදු ඩීසල්, දැවි තෙල් හා තාර යන නිෂ්පාදනවල නිපැයුම ඉහළ යෑම තුළින් අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය පෙර වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.9 ක සෘණ වර්ධනයට සාපේක්ෂව, 2019 වසරේ පළමු භාගයේ දී සියයට 23.0 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. ගෝලීය මිල වෙනස්වීම්වලට අනුව, ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය කිරීම වෙනුවට දේශීය වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන පිරිපහදු කිරීම වඩාත් ලාභදායී විය හැකිය. දැනට පිරිපහදුවේ පවත්නා ධාරිතාව දේශීය අවශ්‍යතාවයෙන් සියයට 30 කට ආසන්න ප්‍රමාණයක් සැපිරීමට ප්‍රමාණවත් වන නිසා, යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීම හා ධාරිතාව ඉහළ නැංවීම මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදු ධාරිතාව ඉහළ නැංවීමට හැකි වන අයුරින් සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීම අවශ්‍ය වේ. සිංගප්පූරුව සහ ඕමානය යන රටවල ආයෝජකයන් විසින් හම්බන්තොට කර්මාන්ත කලාපයේ ස්ථාපිත කිරීමට යෝජිත නව පිරිපහදු ව්‍යාපෘතීන් මධ්‍යකාලීනව රටේ ඛනිජ තෙල් පිරිපහදු ධාරිතාව ඉහළ නැංවීමට සහාය වනු ඇත.

- **වෙනත් ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදන උප අංශය 2019 වසරේ පළමු භාගයේ දී යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කළේය.** මෙම උප අංශය, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 6.6 ක පසුබෑමට සාපේක්ෂව, 2019 වසරේ පළමු භාගය තුළ දී සියයට 7.0 ක වර්ධනයක් වාර්තා කළේය. සිමෙන්ති, වීදුරු බෝතල් හා පෝසිලේන් පිඟන් භාණ්ඩ ඉහළ යෑම මෙම අංශයේ යහපත් වර්ධනයට බලපෑවේය. මෙම උප අංශයට ප්‍රධාන දායකත්වයක් දක්වන දේශීය සිමෙන්ති නිෂ්පාදනය 2019 වසරේ පළමු භාගයේ දී සියයට 23.2 ක ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ අතරම, සිමෙන්ති ආනයනය සියයට 5.9 කින් පහළ ගියේය. සිමෙන්ති නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම, සිමෙන්ති නිපැයුම වැඩිවීමට මූලික වශයෙන් සහාය වී ඇත.

**2.5 රූප සටහන**

**කාර්මික නිෂ්පාදන දර්ශකයේ ප්‍රධාන කාණ්ඩවල වාර්ෂික වෙනස්වීමට දායකත්වය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- **කාර්මික නිෂ්පාදන දර්ශකයට සියයට 10 කට ආසන්න දායකත්වයක් සපයන රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදනය, සම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන සහ රසායනික හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන යන උප අංශ, 2019 වසරේ පළමු භාගයේ දී වර්ධනයක් වාර්තා කළේය.** රබර් ෂීට්, තැටි හා තීරු සහ ප්‍රත්‍යස්ථ ද්‍රව්‍ය නිෂ්පාදනය ඉහළ යෑම රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදන අංශයේ වර්ධනයට හේතු වූ අතර, පාසල් බෑග්, පාසල් පාවහන් හා පිරිමි පාවහන් නිෂ්පාදන කටයුතු ඉහළ යෑම මගින් සම් හා සම් ආශ්‍රිත නිෂ්පාදන උප අංශයේ වර්ධනයක් ඇති විය. මේ අතර, 2018 වසරේ පළමු භාගයේ දී සියයට 6.8 ක සෘණ වර්ධනයක් පෙන්නුම් කළ රසායනික හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය 2019 වසරේ පළමු භාගයේ දී සියයට 3.3 ක වර්ධනයක් අත්කර ගත්තේය. රසායනික නිෂ්පාදන කාණ්ඩයේ වර්ධනයට මූලිකවම බලපාන ලද්දේ පොහොර, තීන්ත හා සනීපාරක්ෂක තුවා ආදී නිෂ්පාදන ඉහළ යෑමය.

- **2019 වසරේ පළමු භාගයේදී, බීම වර්ග නිෂ්පාදන උප අංශයේ වර්ධනය සඳහා බීර සහ සිසිල් බීම වැනි මධ්‍යසාර නොවන පාන වර්ග නිෂ්පාදනය ඉහළ යෑම සහාය වූයේය.** ඒ අනුව, බීම වර්ග නිෂ්පාදන උප අංශය 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 6.1 ක වර්ධනය හා සැසඳීමේ දී 2019 වසරේ පළමු භාගයේ දී සියයට 5.4 ක වර්ධනයක් පෙන්නුම් කළේය. සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේ දී රටේ විශාල ප්‍රදේශයක පැවති නියගය සහ උණුසුම් කාලගුණික තත්ත්වය හේතුවෙන් සිසිල් බීම සඳහා ඉල්ලුම ඉහළ ගියේය. මේ අතර, 2019 වසරේ පළමු කාර්තුවේ දී

මධ්‍යසාර නිෂ්පාදන සඳහා පනවා ඇති සුරා බදු ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආසවනය, සාන්ද්‍රගත මත්පැන් නිපදවීම සඳහා පිරිපහදු කිරීම, මත්පැන් වර්ග සංයෝජනය කිරීම පහළ යෑම මගින් සමස්ත මධ්‍යසාර නිෂ්පාදනය පහළ ගියේය.

- **2019 වසරේ පළමු භාගයේ දී ගෘහ භාණ්ඩ හැර දැව ආශ්‍රිත නිෂ්පාදනය, පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනය සහ විදුලි උපකරණ හා යන්ත්‍රසූත්‍ර නිෂ්පාදනය යන උප අංශ සෘණ වර්ධනයක් පෙන්නුම් කළ අතර, ගෘහ භාණ්ඩ නිෂ්පාදන උප අංශයේ වර්ධනයක් වාර්තා විය.** වානේ හා ඇලුමිනියම් දඬු නිෂ්පාදනය පහළ යෑම හේතුවෙන් පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන අංශය (සියයට 7.7) මන්දගාමී වූ අතර, විදුලි විබෙදුම් පුවරු (electric panel boards), ප්‍රකාශ දියෝඩ (optical isolators) හා අධි ශීතකරණ නිෂ්පාදනය පහළ යෑම හේතුවෙන් විදුලි උපකරණ නිෂ්පාදන උප අංශය ද මන්දගාමීත්වයක් (සියයට 2.1) පෙන්නුම් කළේය. ලී කුඩු පුවරු (medium density fibre boards) සහ තුනී ලෑලි නිෂ්පාදනය පහළ යෑම හේතුවෙන් ගෘහ භාණ්ඩ හැර දැව ආශ්‍රිත නිෂ්පාදන අංශය, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 13.5 ක වර්ධනයට සාපේක්ෂව 2019 පළමු භාගයේ දී සියයට 9.8 ක සෘණ වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, ගෘහ භාණ්ඩ නිෂ්පාදන උප අංශය, පසුගිය වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 13.6 ක පසුබෑමට සාපේක්ෂව, සියයට 4.2 ක වර්ධනයක් වාර්තා කළ අතර ඒ සඳහා ප්ලාස්ටික් පුටු, රබර් මෙට්ට හා කාර්යාල පුටු නිෂ්පාදනය ඉහළ යෑම හේතු විය.

- **දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය, මුද්‍රණය හා පටිගත කරන ලද මාධ්‍ය ප්‍රතිනිෂ්පාදනය සහ මූලික ලෝහ වර්ග නිෂ්පාදනය ද ඇතුළුව කාර්මික නිෂ්පාදන දර්ශකයෙහි, අනෙකුත් උප කාණ්ඩ කිහිපයක් 2019 වසරේ පළමු භාගයේ දී පසුබෑමකට ලක් විය.** සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේ දී දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය සියයට 11.1 කින් තවදුරටත් පහළ ගිය අතර, මුද්‍රණය හා පටිගත කරන ලද මාධ්‍ය ප්‍රතිනිෂ්පාදනය සහ මූලික ලෝහ වර්ග නිෂ්පාදනය යන උප අංශ, පිළිවෙළින් සියයට 3.7 කින් හා සියයට 5.6 කින් පහළ ගියේය. දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන සඳහා අදාළ වන බදු වැඩි කිරීම හේතුවෙන් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයට අහිතකර බලපෑම් එල්ල වූ අතර, එමගින් දුම්කොළ නිෂ්පාදනයට ද බලපෑම් එල්ල විය. මේ අතර, මුද්‍රණය හා පටිගත කරන ලද මාධ්‍ය ප්‍රතිනිෂ්පාදන අංශය මන්දගාමී වීමට බොහෝ දුරට හේතු වූයේ පෙට්ටි කවර හා මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම පහළ යාමයි. මේ අතරවාරයේ දී, රැළි සහිත ඇසුරුම් (corrugated paper), කාඩ්බෝඩ් පෙට්ටි හා කඩදාසි කවර නිෂ්පාදනය ඉහළ යෑම හේතුවෙන්, කඩදාසි හා කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදන අංශය පෙර වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 17.2 ක සෘණ වර්ධනයට සාපේක්ෂව, සලකා බලන කාලපරිච්ඡේදයේ දී සියයට 5.9 ක වර්ධනයක් වාර්තා කළේය.

- **විද්‍යා, තාක්ෂණික හා පර්යේෂණ අමාත්‍යාංශය සහ කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් රටේ කර්මාන්ත අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** විද්‍යා, තාක්ෂණික හා පර්යේෂණ අමාත්‍යාංශය මෙහෙයවනු ලැබූ පළමු ශිල්පසේනා ප්‍රදර්ශනය 2019 වසරේ ජූලි මාසයේ දී සියලුම රේඛීය අමාත්‍යාංශ, රාජ්‍ය සංවිධාන, විශ්වවිද්‍යාල, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, පෞද්ගලික අංශය හා අනෙකුත් අදාළ පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් සාර්ථකව අවසන් කෙරුණි. තවද, ඛනිජ ආශ්‍රිත කර්මාන්ත සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් ජාතික ඛනිජ ද්‍රව්‍ය පිළිබඳ ප්‍රතිපත්තියක් සැකසීම සඳහා අවශ්‍ය යෝජනා විද්‍යා, තාක්ෂණික හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් අඛණ්ඩව ලබා දෙන ලදී. මේ අතර, ව්‍යවසායකයන්ගේ හා ව්‍යවසායකයන් වීමට බලාපොරොත්තුවන්නන්ගේ තාක්ෂණික අවශ්‍යතා සැපිරීම සඳහා තාක්ෂණ හුවමාරු වැඩසටහනක් දිවයින පුරා පිහිටි විද්‍යා සම්පත් මධ්‍යස්ථාන ඔස්සේ 2019 වසරේ පළමු භාගයේ දී පවත්වන ලදී. මහජනයා මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබා දෙන අතරම තාක්ෂණික යෙදවුම් පුළුල් කිරීම සඳහා විද්‍යා, තාක්ෂණික හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික්ක 15 ක ග්‍රාමීය ප්‍රජාව ආවරණය වන පරිදි විද්‍යා හා තාක්ෂණ විශේෂ ව්‍යාපෘති 33 ක් සඳහා රුපියල් මිලියන 12.2 ක් වෙන් කර ඇත. මේ අතර, ආනයනික රසායනික පොහොර භාවිතය අඩු කිරීම සඳහා ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් ක්ෂුද්‍ර ජීවී ජෛව පොහොර නිපදවීමට අදාළ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ජාතික මූලික අධ්‍යයන ආයතනය මගින් වී වගාව සඳහා 2019 වසරේ දී අක්කර 15,000 ක් සහ 2020 දී අක්කර 50,000 ක් සඳහා ජෛව පොහොර

යෙදවීමට අපේක්ෂා කෙරේ. මේ අතර, 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' (Enterprise Sri Lanka) ණය යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවේ මෙකට්‍රොනික් තාක්ෂණය පදනම් කරගත් නිෂ්පාදන දියුණු කිරීමට ආරම්භ කරන සමාගම්වලට සහ මෙකට්‍රොනික් නිෂ්පාදන සැලසුම් කිරීම හා සහතික කිරීමේ කටයුතු වෙනුවෙන් දිගුකාලීන ණය පහසුකම් ලබා දීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ඉහළ අගයක් එකතු කළ වෙළඳපොළ පදනම් කරගත් නිෂ්පාදන අපනයන වෙළඳපොළ වෙනුවෙන් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක වන කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 'එන්ටර්ප්‍රයිස් ගම් සංවර්ධන' (Enterprise Village Development) වැඩසටහන යටතේ, 2019 වසරේ දී නව ව්‍යවසායකයන් 444 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂා කරන අතර, 'ශිල්ප සවිය' වැඩසටහන යටතේ ව්‍යවසායකයින් 48 දෙනෙකුට ප්‍රතිලාභ සැලසීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන් දෙකෙහිම ප්‍රතිලාභීන්ගෙන් සියයට 80 කට වැඩි ප්‍රමාණයක් කාන්තාවන් වේ.

- **ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, විවිධ අදාළ අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන හා කර්මාන්ත මණ්ඩල විසින් දේශීය කර්මාන්ත අංශය ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී.** 2017 වසරේ සිට, හම්බන්තොට කාර්මික කලාපයේ ආයෝජනය කිරීම සඳහා සමාගම් දෙකක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් අත්සන් කර ඇත. එ.ජ. ඩොලර් මිලියන 3,850 ක ආයෝජනයක් වන සිල්වර් පාර්ක් තෙල් පිරිපහදු ව්‍යාපෘතිය සඳහා 2019 වසරේ දී ගිවිසුම් අත්සන් තබන ලද අතර, 2018 වසරේ දී ලංවා සංස්ථා සිමෙන්ති පුද්ගලික සංස්ථාව විසින් එ.ජ. ඩොලර් මිලියන 100 ක ඇස්තමේන්තුගත ආයෝජනයක් සහිත ගිවිසුමකට අත්සන් තබන ලදී. මීට අමතරව, සිංගප්පූරුවේ සුගී බලශක්ති ජාත්‍යන්තර සමාගමට හම්බන්තොට කර්මාන්ත කලාපයේ පිරිපහදු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. කෙසේ වුවද, මෙම පිරිපහදු ව්‍යාපෘතිය සඳහා අවසාන අනුමැතිය පාරිසරික බලපෑම් තක්සේරුවක් සිදු කිරීමෙන් පසුව හිමි වනු ඇත. මේ අතර, ජාත්‍යන්තර වෙළඳපොළේ ඉහළ යන ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය විවිධ සේවා සපයන අතරම, ටයර් හා ඇලුමිනියම්වලින් නිෂ්පාදිත ආහාර බහලුම් ඇතුළු කාර්මික නිෂ්පාදන වර්ග කිහිපයක් නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ කර්මාන්තශාලා පිහිටුවීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ පෞද්ගලික සමාගම් රැසක් ගිවිසුම්වලට එළඹී ඇත. 2019 පළමු භාගයේ දී ජාතික වාණිජ මණ්ඩලය, දිවයිනේ විවිධ ප්‍රදේශවල පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය දැනුම්වත් කිරීම හා නගා සිටුවීම සඳහා අඛණ්ඩව කටයුතු කළේය. තවද, දේශීය හා බටහිර වෛද්‍ය ක්‍රමයේ ඖෂධ නිෂ්පාදන හා සේවා ප්‍රවර්ධනයට අවස්ථාව සලසා දීමේ අරමුණින් ජාතික වාණිජ මණ්ඩලය හා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය එක්ව 2019 වසරේ ජූලි මාසයේ දී "ජාත්‍යන්තර සෞඛ්‍ය සේවා ප්‍රදර්ශනය" පවත්වන ලදී. මේ අතර, කාර්මික තාක්ෂණ ආයතනය විසින්, 2019 වසරේ දී, විශේෂයෙන්ම යාපනය, කිලිනොච්චිය හා වවුනියා දිස්ත්‍රික්කවල තෝරා ගත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දියුණු කිරීම සඳහා ආහාර, තාක්ෂණ ක්ෂේත්‍රයේ සේවා රැසක් සපයන ලදී. මේ අතර, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් 2019 වසරේ පළමු භාගයේ දී කර්මාන්ත කලාප ආශ්‍රිතව යටිතල පහසුකම් නවීකරණය කිරීම හා වැඩිදියුණු කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

## සේවා

- **ආර්ථිකයට විශාලතම දායකත්වය සපයන සේවා ආශ්‍රිත ආර්ථික කටයුතු 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 5.1 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 2.8 කින් වර්ධනය විය.** මෙම කාලසීමාවේ දී මූල්‍ය සේවා සහ තොග හා සිල්ලර වෙළඳාම් කටයුතු මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය. තවද, වෙනත් පෞද්ගලික සේවා, දේපළ වෙළඳාම් කටයුතු, රාජ්‍ය පරිපාලන සේවා, රක්ෂණය, විදුලි සංදේශ සේවා, වෘත්තීයමය සේවා, තොරතුරු තාක්ෂණ සේවා හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්, අධ්‍යාපන සේවා සහ සෞඛ්‍ය සේවා ඇතුළු අනෙකුත් සේවා කටයුතු ද මෙම වසරේ පළමු භාගයේ දී සේවා කටයුතුවල සිදු වූ වර්ධනයට ධනාත්මකව දායක විය. කෙසේ වුවද, පාස්කු ඉරිදා ප්‍රහාරයන්ගේ අහිතකර බලපෑම හේතුවෙන් නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවා පහත වැටුණු අතර ප්‍රවාහන සේවා කටයුතු අඩු වේගයකින් වර්ධනය විය.

## වෙළඳාම, ප්‍රවාහන සේවා, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවා

- **තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය හා ගබඩාකරණය සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා කටයුතු 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 4.7 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී**

සියයට 1.3 ක අඩු වේගයකින් වර්ධනය විය. මෙහි දී, 2018 වසරේ පළමු භාගයේ දී සියයට 5.5 ක වර්ධනයක් වාර්තා කළ තොග හා සිල්ලර වෙළඳාම් කටයුතු 2019 වසරේ පළමු භාගයේ දී සියයට 2.8 ක මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, තොග හා සිල්ලර වෙළඳාම් කටයුතු, 2019 වසරේ පළමු භාගයේ දී සමස්ත සේවා කටයුතු වාර්තා කරන ලද වර්ධනයට ප්‍රධාන දායකත්වයක් දක්වන ආර්ථික කටයුත්තක් ලෙස තවදුරටත් පැවතුණි. මේ අතර, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවා ආශ්‍රිත කටයුතු, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 7.1 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 2.6 ක පහත වැටීමක් වාර්තා කළ අතර, ප්‍රවාහන සේවා ආශ්‍රිත කටයුතු, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.4 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 0.2 ක අඩු වේගයකින් වර්ධනය විය. පාස්කු ඉරිදා ප්‍රහාර හේතුවෙන් සංචාරක කර්මාන්තය ආශ්‍රිත කටයුතු සඳහා සිදු වූ අහිතකර බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, තැපැල් හා කුරියර් සේවා ආශ්‍රිත කටයුතු, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 2.4 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ එම කාලසීමාවේ දී සියයට 2.9 ක වර්ධනයක් වාර්තා කළේය.

### තොරතුරු සහ සන්නිවේදනය

- **තොරතුරු හා සන්නිවේදන කටයුතු, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 10.0 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 10.9 කින් වර්ධනය විය.** මේ සඳහා, විදුලි සංදේශ සේවා, 2018 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 10.4 ක වර්ධනයට සාපේක්ෂව, 2019 වසරේ පළමු භාගය තුළ දී තවදුරටත් සියයට 10.9 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත කර්මාන්තවල අඛණ්ඩ වර්ධනය පිළිබිඹු කරමින් පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවා 2018 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 11.3 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී සියයට 11.9 කින් වර්ධනය විය. මේ අතර, ගුවන්විදුලි හා රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 2.0 ක පහළ යෑමට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 4.6 ක වර්ධනයක් වාර්තා කරන ලදී.

### මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම

- **මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම් ආශ්‍රිත කටයුතු 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 8.5 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 5.5 කින් වර්ධනය විය.** මෙහිදී, මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා සහ ඒ ආශ්‍රිත වෙනත් සේවා 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 11.5 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 8.8 කින් වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. තවද, නිවාස අයිතිය හා දේපළ වෙළඳාම් කටයුතු, 2018 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ සියයට 5.3 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 1.6 කින් වර්ධනය වෙමින් මෙම කාණ්ඩයේ සමස්ත වර්ධනයට හිතකර ලෙස දායක විය. තවද, රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 7.0 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ මෙම කාලසීමාවේ දී සියයට 7.3 කින් වර්ධනය විය.

### වෘත්තීයමය සේවා සහ වෙනත් පෞද්ගලික සේවා

- **වෘත්තීයමය සේවා සහ වෙනත් පෞද්ගලික සේවා, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 5.4 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 2.9 කින් වර්ධනය විය.** වෙනත් පෞද්ගලික සේවා, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 5.4 ක වර්ධනයට සාපේක්ෂව අඩු වේගයකින් වුවද 2019 වසරේ පළමු භාගයේ දී සියයට 3.0 කින් වර්ධනය වීම මෙම කාණ්ඩයෙහි වර්ධනය සඳහා මූලිකවම දායක විය. තවද, වෘත්තීයමය සේවා 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 5.8 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ එම කාලසීමාවේදී සියයට 2.0 කින් වර්ධනය විය.

### රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවා

- **2018 වසරේ පළමු භාගයේ දී සමස්තයක් ලෙස වර්ධනයක් පෙන්නුම් නොකරන ලද රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවා 2019 වසරේ පළමු භාගයේ දී සියයට 1.3 කින් වර්ධනය විය.** 2018 වසරේ පළමු භාගයේ දී

සියයට 0.8 කින් පහත වැටුණු රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය සම්බන්ධ සේවා 2019 වසරේ පළමු භාගයේ දී සියයට 1.7 කින් වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී. මේ අතර, අධ්‍යාපන සේවා කටයුතු, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 3.4 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 0.9 ක අඩු වේගයකින් වර්ධනය විය. තවද, සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවා හා සමාජ ආරක්ෂණ සේවා කටයුතු, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 1.6 ක පහත වැටීමට සාපේක්ෂව 2019 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.8 කින් වර්ධනය විය.

### වියදම

- **පරිභෝජන සහ ආයෝජන වියදමෙන් සමන්විත වන දළ දේශීය වියදම (ද.දේ.වි.) පවත්නා වෙළඳපොළ මිල අනුව 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 10.2 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 0.2 ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී.** මෙම අඩු වර්ධනය සඳහා ආයෝජන වියදමෙහි දක්නට ලැබුණු සැලකිය යුතු පසුබෑම හේතු විය. ඒ අනුව 2018 වසරේ පළමු භාගයේ දී සියයට 9.9 ක වර්ධනයක් වාර්තා කළ ආයෝජන වියදම් 2019 වසරේ පළමු භාගයේ දී සියයට 13.3 කින් පහත වැටුණි. ආයෝජන වියදමෙහි සංරචක සලකා බැලීමේ දී, දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වර්ධනයක් වාර්තා කළ ද, තොග/පරිලේඛන වෙනස්වීම් සහ වටිනා දේ අත්පත් කර ගැනීම් සහ අත්හැරීම් සැලකිය යුතු ලෙස පහත වැටීම ආයෝජන වියදම පහත වැටීම කෙරෙහි බලපාන ලදී. පරිභෝජන වියදම් ද, පවත්නා වෙළඳපොළ මිල අනුව 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 10.4 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 5.4 ක වර්ධනයක් වාර්තා කරමින්, සමස්ත දළ දේශීය වියදමෙහි වර්ධනයට හිතකර ලෙස දායක විය. මේ අතර, 2018 වසරේ පළමු භාගයේ දී පවත්නා වෙළඳපොළ මිල අනුව සියයට 21.6 ක පහත වැටීමක් වාර්තා කළ ශුද්ධ විදේශීය ඉල්ලුම, 2019 වසරේ පළමු භාගය තුළ දී සියයට 41.9 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. මේ සඳහා, ආනයනවල සිදු වූ පසුබෑම මෙන්ම, අපනයනවල සිදු වූ සැලකිය යුතු වර්ධනය ද බලපාන ලදී. මෙහිදී, පවත්නා වෙළඳපොළ මිල අනුව භාණ්ඩ සහ සේවා අපනයන,

**2.6 රූප සටහන**

**ආයෝජන සහ ඉතුරුම් ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස (අ)**




(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇස්තමේන්තු කරන ලද අගයයන්.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 12.3 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී සියයට 13.9 කින් වර්ධනය විය. මේ අතර, භාණ්ඩ සහ සේවා ආනයන, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 14.8 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 1.5 කින් පහත වැටුණි. ඒ අනුව, ද.දේ.වි. සහ ශුද්ධ විදේශීය ඉල්ලුමෙන් සමන්විත වන ද.දේ.නි., පවත්නා වෙළඳපොළ මිල අනුව 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 9.4 ක වර්ධනයට සාපේක්ෂව, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී සියයට 3.8 ක වර්ධනයක් වාර්තා කරන ලදී.

- **පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.වි., 2018 වසරේ දී වාර්තා කළ සියයට 7.9 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ දී රුපියල් බිලියන 16,436.4 ක් දක්වා සියයට 6.0 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත.** මෙම අපේක්ෂිත වර්ධනය කෙරෙහි පරිභෝජනය මෙන්ම ආයෝජන වියදම්හි වර්ධනය ද දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ශුද්ධ විදේශීය ඉල්ලුම පෙර වසරේ දී වාර්තා කළ සියයට 10.3 ක පහත වැටීමට සාපේක්ෂව 2019 වසර තුළ දී සියයට 10.6 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙහිදී, ගෝලීය ආර්ථිකයේ මන්දගාමීත්වය හමුවේ වුවද, අපනයන වර්ධනය වෙමින්, ආනයන මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මේ අනුව, පවත්නා වෙළඳපොළ මිල අනුව, ද.දේ.නි. 2018 වසරේ දී වාර්තා කළ සියයට 7.7 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 7.2 ක වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## පරිභෝජනය

- **ආර්ථිකයෙහි විශාලතම වියදම් කාණ්ඩය වන පරිභෝජන වියදම, පවත්නා වෙළඳපොළ මිල අනුව 2018 වසරේ දී වාර්තා කළ සියයට 8.3 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ දී රුපියල් බිලියන 11,929.6 ක් දක්වා සියයට 4.8 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත.** ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස පරිභෝජන වියදම 2018 වසරේ දී සියයට 78.8 ක් වූ අතර, 2019 වසරේ දී එය සියයට 77.0 ක් වේ යැයි බලාපොරොත්තු වේ. පෞද්ගලික මෙන්ම රාජ්‍ය පරිභෝජන වියදම් අඩු වේගයකින් වුව ද වර්ධනය වෙමින්, සමස්ත පරිභෝජන වියදමෙහි වර්ධනයට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, පවත්නා වෙළඳපොළ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදම, 2018 වසරේ දී වාර්තා කළ සියයට 7.4 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 5.1 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2019 වසරේ පළමු භාගය තුළ දී රාජ්‍ය පරිභෝජන වියදමෙහි දත්ත සහ 2019 වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පුරෝකථන අනුව සලකා බැලීමේ දී, රාජ්‍ය අංශයෙහි පරිභෝජන වියදම ද 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය.

## ආයෝජන

- **2019 වසරේ දී ආයෝජන වියදම්, පවත්නා වෙළඳපොළ මිල අනුව 2018 වසරේ දී වාර්තා කළ සියයට 6.8 ක වර්ධනයට සාපේක්ෂව, සියයට 9.1 කින් වර්ධනය වේ යැයි පුරෝකථනය කෙරේ.** තවද, ආයෝජන වියදම ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ දී සියයට 28.6 ක් වූ අතර, 2019 වසරේ දී එය සියයට 29.1 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මැතිවරණ හේතුවෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ රාජ්‍ය ආයෝජනවල යම් ඉහළ යෑමක් ඇති විය හැකි වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථනවලට අනුව, 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී රාජ්‍ය ආයෝජනවල සමස්ත පසුබෑමක් අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2019 වසරේ දී ආයෝජන වියදමෙහි වර්ධනය සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන වියදම් වැඩි වශයෙන් දායක වනු ඇත. පෞද්ගලික නිවාස මිලදී ගැනීම්/ඉදිකිරීම්/අලුත්වැඩියා කිරීම් සඳහා පෞද්ගලික අංශය වෙත වාණිජ බැංකුවලින් ලබා දෙන ලද ණය ප්‍රමාණය, 2018 වසරේ ජුනි මාසය අවසානය වන විට වාර්තා කළ සියයට 14.6 ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේ ජුනි මස අවසානය වන විට සියයට 7.6 ක වර්ධනයක් වාර්තා කරන ලදී. සමස්ත ආයෝජනවලට ප්‍රධාන දායකත්වයක් දක්වන ඉදිකිරීම් ආශ්‍රිත ආයෝජන කටයුතුවල වර්ධනයක් දක්නට ලැබුණු අතර එය 2019 වසරේ පළමු භාගය තුළ සිමෙන්ති උපයෝජ්‍යතාවයේ ඉහළ යාම තුළින් ද පිළිබිඹු වේ. කෙසේ වුව ද, ආනයන පරිමා දර්ශක මගින් පිළිබිඹු වූ ආකාරයට, වසරේ පළමු භාගය තුළ දී, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයනය සහ වෙනත් ආයෝජන භාණ්ඩ ආනයනය පහත වැටුණි.

- **ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලද ව්‍යාපෘතිවලට ලැබුණු ණය ද ඇතුළුව විදේශීය ඍජු ආයෝජන[1] 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,427.9 ක අගයට සාපේක්ෂව 2019 පළමු භාගයේ දී එ.ජ. ඩොලර් මිලියන 553.2 ක් දක්වා සියයට 61.3 ක සෘණ වර්ධනයක් පෙන්නුම් කළේය.** යටිතල පහසුකම් ව්‍යාපෘති හා සේවා අංශය සඳහා වූ විදේශීය ඍජු ආයෝජන ගලාඒම්, පිළිවෙළින් සියයට 75.8 කින් හා 11.1 කින් පහළ යාම හේතුවෙන් සලකා බලන කාලපරිච්ඡේදයේ දී විදේශීය ඍජු ආයෝජන ගලා ඒම මන්දගාමී විය. කෙසේ වුවද, සලකා බලන කාලපරිච්ඡේදයේදී ලැබුණු ඍජු විදේශීය ආයෝජනවලින් හතරෙන් එකකට පමණ දායකත්වය දැක්වූ නිෂ්පාදන අංශයට ලැබුණු ආයෝජන ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 138.6 දක්වා සියයට 10.7 කින් වර්ධනය විය. මේ අතර, කෘෂිකාර්මික අංශයට ලැබුණු ඍජු විදේශීය ආයෝජන 2019 වසරේ පළමු භාගයේ දී ද සීමිත විය.

## ඉතුරුම්

- **2019 වසරේ දී ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස දේශීය මෙන්ම ජාතික ඉතුරුම් ද පෙර වසරට සාපේක්ෂව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ඒ අනුව, ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම්, 2018 වසරේ දී පැවති සියයට 21.2 ක අගයට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 23.0 ක් දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. දේශීය ඉතුරුම්වල මෙම

---

1 මෙහි දක්වා ඇති විදේශීය ඍජු ආයෝජන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි සමාගම් වෙත ලද ණයද ඇතුළුව වූ ලැබීම් වන අතර මෙම ඇස්තමේන්තු පස් වන පරිච්ඡේදයේ දක්වා ඇති අගයන්ගෙන් වෙනස් විය හැකිය. මෙවැනි වෙනසක් සඳහා පස් වන පරිච්ඡේදයේ දක්වා ඇති ඇස්තමේන්තුවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි වී නොමැති සමාගම් වෙත ලැබුණු ඍජු ආයෝජන ඇතුළත් වීම ප්‍රධාන වශයෙන් හේතු වේ.

වර්ධනය කෙරෙහි පෞද්ගලික ඉතුරුම්වල වර්ධනය මෙන්ම රාජ්‍ය නිර්-ඉතුරුම්වල අඩු වර්ධනය ද බලපානු ඇත. මේ අතර, 2018 වසරට සාපේක්ෂව රුපියල් වටිනාකම අනුව, ශුද්ධ ප්‍රාථමික ආදායම 2019 වසරේ දී වැඩි වේගයකින් පහත වැටීමක් අපේක්ෂා කරන අතර, ශුද්ධ වර්තන සංක්‍රාම අඩු වේගයකින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, ජාතික ඉතුරුම් ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ දී වාර්තා කළ සියයට 25.4 ට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 26.5 ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. තවද, ඉතුරුම්-ආයෝජන පරතරය, ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ දී වාර්තා කළ සියයට 3.1 ට සාපේක්ෂව 2019 වසරේ දී සියයට 2.6 ක් දක්වා අඩු වනු ඇත.

## අපේක්ෂිත වර්ධනයන්

- **ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වසරේ දී මූර්ත වශයෙන් සියයට 3.5 කින් පමණ වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත.** මෙම වර්ධනය කෙරෙහි සියලු ප්‍රධාන ආර්ථික කටයුතු ධනාත්මකව දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, දේශීය වශයෙන් පැවති අවිනිශ්චිතතා හේතුවෙන් අහිතකර බලපෑමට ලක් වූ ආයෝජකයින්ගේ විශ්වාසය, පෞද්ගලික ආයෝජන ඉහළ නංවමින් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ජාතික මැතිවරණවලට සමගාමීව රජයේ වියදම් ඉහළ යෑම මෙන්ම පාරිභෝගික හැසිරීම සාමාන්‍ය අතට හැරීමත් සමගම පෞද්ගලික පාරිභෝජන වියදම් ඉහළ යෑම ද හේතුවෙන් වසර තුළ දී දේශීය ඉල්ලුම ශක්තිමත් වනු ඇත. ප්‍රධාන වෙළඳ පාර්ශ්වකාර රටවල් සමග ඇති කර ගන්නා වරණීය වෙළඳ ගිවිසුම් සහ ගෝලීය ඛනිජ තෙල් මිල පහත වැටීම හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රතිලාභ ලබනු ඇත. අපනයන තවදුරටත් විවිධාංගීකරණය කිරීම හා ජාත්‍යන්තර වෙළඳාම හා සම්බන්ධ අංශ වැඩිදියුණු කිරීමත්, ආර්ථිකයෙහි විදේශීය අංශය තිරසාර ලෙස වර්ධනය වීම සඳහා සහාය වනු ඇත.

- **2020 වසරේදී කෘෂිකාර්මික අංශය යළි වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුව 2018/19 මහ කන්නයේ සහ 2019 යල කන්නයේ අතිරික්ත නිෂ්පාදනය හේතුවෙන් 2020 වසරේ ජනවාරි මස දක්වා ගෘහස්ථ ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් තරමට සහල් ඇත. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ ඔක්තෝබර් හා නොවැම්බර් මාසවල දී ඇඩි වර්ෂාපතනයක් ලැබෙනු ඇතැයි පුරෝකථනය කළ ද, ඉතා පහළ මට්ටමක ඇති ප්‍රධාන ජලාශයන්හි ජල මට්ටම ඉහළ නැංවීමට තරම් මෙතෙක් ලද වර්ෂාපතනය ප්‍රමාණවත් නොවනු ඇති අතර, 2019/20 මහ කන්නයේ ජල අවශ්‍යතාවය සපුරාලීමට එය බාධාවක් වනු ඇත. එබැවින්, දේශගුණික අවදානම් අවම කිරීම, අනුවර්තන පියවර හා නියං තත්ත්ව සඳහා මුහුණ දීමට සිදුකරන මැදිහත්වීම් සඳහා සූදානම් වීම කෙරෙහි වැඩි අවධානයක් යෙදවීම අවශ්‍ය වේ. 2019 වසරේ මුල් භාගය තුළ දී දේශීය වෙළෙඳපොළ තුළ තේ හා රබර් මිල ගණන් අඛණ්ඩව පහළ යෑම හේතුවෙන් දේශීය නිෂ්පාදනය දුර්වල වූ නමුත්, එම භාණ්ඩ ආනයනය කරන රටවල ආර්ථිකයන් යළි යථා තත්ත්වයට පත්වීමට ඉඩ ප්‍රස්ථා ඇති බැවින් ඒ සමඟ එම ආනයන සඳහා වන ගෝලීය ඉල්ලුම යළිත් වර්ධනය විය හැක. මේ අතර, පොල් නිෂ්පාදනයේ අපේක්ෂිත වර්ධනය, පොල් ආශ්‍රිත කර්මාන්තයන්ගේ ඉහළ යන ඉල්ලුම සපුරාලීමට සමත් වනු ඇති අතර පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ද දිරිමත් කරනු ඇත. තවද, බඩ ඉරිඟු, අර්තාපල්, රතුළූණු, උඳු හා ලොකු ළූණු වැනි ක්ෂේත්‍ර භෝගයන්ගේ දේශීය නිෂ්පාදනය යහපත් කාලගුණික තත්ත්වවල උපකාරීත්වය ඇතිව අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. කර්මාන්ත ශාලාවන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම සහ පශු වෛද්‍ය සේවා නිසි ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් නිෂ්පාදන හැකියාව වර්ධනය වීම තුළින් 2020 වසරේ දී දේශීය දියර කිරි කර්මාන්තය ගෘහස්ථ කිරි අවශ්‍යතාවයෙන් සියයට 45 ක් පමණ සපුරනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, දේශීය සීනි නිෂ්පාදනය 2020 වසරේ දී සමස්ත දේශීය සීනි ඉල්ලුමෙන් සියයට 12 ක් පමණ සම්පූර්ණ කරනු ඇතැයි බලාපොරොත්තු වේ. මේ අතර, ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ දී රටේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. දේශීය කෘෂිකර්මාන්තයේ මෙම සැපයුම් වර්ධනයත් සමඟ 2020 වසරේ දී කෘෂිකර්මාන්තය සමස්ත ආර්ථික වර්ධනයට ධනාත්මකව දායක වනු ඇතැයි අපේක්ෂිතය.

- **ආයෝජකයන්ගේ විශ්වාසය වැඩිදියුණු වීමත් සමඟම, කර්මාන්ත ආශ්‍රිත ආර්ථික කටයුතු 2020 වසරේ දී තවදුරටත් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.**

නිෂ්පාදන කර්මාන්ත හා ඉදිකිරීම් කටයුතුවල වර්ධනය, කර්මාන්ත කටයුතුවල වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සඳහා ජී.එස්.පී. ප්ලස් සහනයෙන් නිෂ්පාදන කර්මාන්ත කටයුතු ප්‍රතිලාභ ලැබීමත් පෞද්ගලික ඉදිකිරීම් කටයුතු සඳහා උත්තේජනයක් සපයමින් රජයේ ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් කර ඇති පරිදි ක්‍රියාත්මක වීමත් හේතු වනු ඇත. මධ්‍යම අධිවේගී මාර්ගය සහ සැහැල්ලු දුම්රිය පද්ධතියේ පළමු අදියර වැනි රජයේ මූලිකත්වයෙන් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති වේගවත් කිරීමත් සමඟ ඉදිකිරීම් කටයුතු ඉහළ වේගයකින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, කොළඹ වරාය නගරයේ ඉදිකිරීමට නියමිත ගොඩනැගිලි, නව කැලණි පාලමේ සිට පොළවට ඉහළින් ඉදිවන මාර්ගය සහ වරාය නගරය කොළඹ සෙසු වාණිජ ප්‍රදේශ සමග සම්බන්ධ කරමින් ඉදිවන උමං මාර්ගය ඇතුළුව කොළඹ නගරය තුළ හා ඉන් පිටත යටිතල පහසුකම් සංවර්ධන කටයුතු දියත් කිරීමට නියමිතය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දෙවන පර්යන්තය සංවර්ධනය කිරීම සහ යාපනය (පලාලි), රත්මලාන සහ මඩකලපුව යන අභ්‍යන්තර ගුවන් තොටුපළ තුන ජාත්‍යන්තර ගුවන් තොටුපළවල් ලෙස වැඩිදියුණු කිරීම ද, ඉදිරි සංවර්ධනයට දායක වෙතැයි අපේක්ෂිත ගුවන් සේවා ආශ්‍රිත ඉදිකිරීම් ව්‍යාපෘති අතර වේ. පෞද්ගලික අංශය මගින් දියත් කර ඇති විවිධ සහාධිපත්‍ය මහල් නිවාස සංවර්ධන ව්‍යාපෘතිවලට (Condominium Development Projects) අමතරව, නාගරික පුනර්ජීවනය (Urban re-generation) ව්‍යාපෘති යටතේ ඉදිවෙමින් පවතින නිවාස ව්‍යාපෘති විශාල සංඛ්‍යාව මගින්, දැරිය හැකි මිල ගණන්වලට සැපයෙන නාගරික නිවාස සඳහා ඇති ඉල්ලුම යම් පමණකට හෝ සපුරාලනු ඇත. මේ අතර, නිෂ්පාදන කර්මාන්ත, විශේෂයෙන්ම රෙදිපිළි හා ඇඟලුම් සහ ආහාර හා පාන වර්ග නිෂ්පාදන, කර්මාන්ත කටයුතු සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාව ඇඟලුම් අපනයනය කරන රටවලින් ජනනය කෙරෙන ඉහළ ඉල්ලුම ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තවල වර්ධනයට උපකාරී වනු ඇත. තවද, සංචාරක අංශයෙන් කෙරෙන ඉල්ලුම ක්‍රමිකව ඉහළ යන අතරම මූලික වශයෙන් දේශීය වෙළඳපොළ ඉල්ලුම, ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්තවල වර්ධනය කෙරෙහි හේතු වනු ඇත. එමෙන්ම වරණීය වෙළඳ ගිවිසුම්, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තවල තිරසාර වර්ධනයට දායක වනු ඇත. තවද, අප රට ගෝලීය අගය දාමයට වඩාත් සම්බන්ධ කරවමින් අපනයන විවිධාංගීකරණය සහ ඛනිජ නිෂ්පාදන වැනි අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම මගින් කර්මාන්ත ආශ්‍රිත කටයුතු ඉන් ප්‍රතිලාභ ලබනු ඇත. ඇමෙරිකා එක්සත් ජනපදය හා චීනය අතර පවතින වෙළඳ සම්බන්ධතා පදනම් කරගත් ගැටුම්කාරී වාතාවරණයට නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය ඇඩිව අනාවරණය වෙමින් පවතී. මේ තත්ත්වය යටතේ ධාරිතා උපයෝජනය උපරිම කිරීම, ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීම, භාණ්ඩ හා සේවාවල තත්ත්වය ඉහළ නැංවීම, සැපයුම් දාමයේ සහයෝගීත්වය නැංවීම හා ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා වැඩිදියුණු කිරීම මත දේශීය නිෂ්පාදන කර්මාන්තවල දිගුකාලීන වර්ධනය රඳා පවතී. කෙසේ වුවද, නොවෙනස් ප්‍රතිපත්ති, ආයෝජකයින්ට හිතකර රාජ්‍ය යාන්ත්‍රණය මෙන්ම ප්‍රපාතන විරෝධී නීති ද තිරසාර කාර්මික සංවර්ධනයක් සඳහා වන පූර්ව අවශ්‍යතා අතර වේ. නිපුනතාවල නොගැලපීම්, අඩු ශ්‍රම ඵලදායිතාවය, දැඩි කම්කරු නීති වැනි ව්‍යුහාත්මක සීමා, කර්මාන්ත කටයුතුවල පූර්ණ විභවතාව අත්කර ගැනීම සඳහා විසඳුම් ලබා දිය යුතු අංශ ලෙස හඳුනා ගෙන ඇත. ඉදිරි කාලයේ දී, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා අඛණ්ඩව ආයෝජනය කරන අතර, ඉහළ තාක්ෂණයන් වැඩි වශයෙන් භාවිතා කිරීම දිරිගැන්වීම සඳහා විශේෂයෙන්ම තාක්ෂණික හුවමාරුව, විද්‍යාව සහ නවෝත්පාදන සඳහා වඩා හිතකර ප්‍රතිපත්ති අවශ්‍ය කෙරේ.

- **සේවා ආශ්‍රිත සියලුම ප්‍රධාන ආර්ථික කටයුතුවල දායකත්වයෙන්, සේවා කටයුතු 2020 වසරේ දී ද ආර්ථික වර්ධනය කෙරෙහි වැඩි දායකත්වයක් දක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මෙම වර්ධනය කෙරෙහි තොග හා සිල්ලර වෙළඳාම, මූල්‍ය සේවා, රක්ෂණය, විදුලි සංදේශ සේවා, ප්‍රවාහනය හා වෘත්තීයමය සේවා මෙන්ම රාජ්‍ය අංශය මගින් වැඩි වශයෙන් මෙහෙයවන රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අධ්‍යාපනය හා සෞඛ්‍ය ආශ්‍රිත සේවාවන්ගෙන් වැඩි දායකත්වයක් දක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. හෝටල් හා ආපනශාලා සේවා ඇතුළත් නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවා වැනි පාස්කු ඉරිදා ප්‍රහාරවලින් දැඩි බලපෑමකට ලක් වූ සේවා වසර තුළ දී නැවත යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංචාරක කර්මාන්තයේ ධාරිතාව ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන යෑම සඳහා කෙටිකාලීන මෙන්ම දිගුකාලීන උපායමාර්ග ද

අවශ්‍ය වේ. බොහොමයක් සේවා කටයුතු අනෙකුත් ආර්ථික කටයුතු හා එකිනෙකට අනුපූරක වන බැවින් පුළුල් පරාසයක පැතිරුණු ආර්ථික වර්ධනයක් සඳහා දායකත්වය සපයනු ඇත. උදාහරණයක් වශයෙන් මහාමාර්ග/අධිවේගී මාර්ග හා දුම්රිය මාර්ග පද්ධතිය පුළුල් වීම සහ ගුවන් තොටුපළ පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම්වලින් ප්‍රවාහන කටයුතු ඍජුවම ප්‍රතිලාභ ලබනු ඇත. මෙලෙස ගමනාගමනය දියුණු වීමෙන් ශ්‍රී ලංකාව ආයෝජකයින් මෙන්ම සංචාරකයින්ටත් ආකර්ශණීය ස්ථානයක් වේ. තවද, පුද්ගලික ප්‍රවාහන ක්‍රම වෙනුවට වඩා හොඳ පොදු ප්‍රවාහන ක්‍රම ආදේශ වීමෙන් ආර්ථිකයට වැඩි අගයක් එකතු කෙරෙනු ඇත. එලෙසම ශ්‍රී ලංකාව පර්යේෂණ හා සංවර්ධන, සෞඛ්‍ය හා සුවතා, උසස් අධ්‍යාපනය, තොරතුරු තාක්ෂණික සංවර්ධනයන් හා උපදේශක සේවා වැනි ඉහළ වටිනාකමක් සහිත සේවා අපනයනය කරන රටක් බවට පත්විය යුතුය. සාම්ප්‍රදායික තොරතුරු තාක්ෂණ පද්ධතීන් වෙනුවට කෘතිම බුද්ධිය (Artificial Intelligence) හා බැඳුණු තාක්ෂණික විසඳුම් ඉදිරි තාක්ෂණික පුනරුදයට නායකත්වය දෙනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, ගෝලීය වශයෙන් ඇති වීමට නියමිත ඉල්ලුම සපුරාලීම සඳහා තොරතුරු තාක්ෂණ කර්මාන්තයෙහි විභවතාව වැඩිදියුණු වීම වැදගත් වේ. මේ අතර, එවැනි සේවා අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා ආයෝජන ආකර්ෂණය කර ගැනීමට හා නව තාක්ෂණය භාවිතා කිරීමට විධිමත් උපක්‍රම සහ ඊට සහාය දෙන පරිසරයක් ද අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාව ඉහළ වටිනාකම් සහිත සේවා අපනයනකරුවෙකු ලෙස තිරසාරව රැඳී සිටීමට නම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, විද්‍යාව, තාක්ෂණය හා නව නිමැවුම් වැනි ක්ෂේත්‍රවල පර්යේෂණ හා සංවර්ධන කටයුතු ශක්තිමත් කිරීම රජයේ ප්‍රමුඛතා අතර විය යුතුය.

- **ප්‍රධාන වශයෙන්ම පෞද්ගලික අංශයේ ආයෝජන කටයුතුවල ඉහළ දායකත්වය හේතුවෙන්, 2020 වසරේ දී සමස්ත ආයෝජන කටයුතුවල වර්ධනය අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ඍජු විදේශ ආයෝජනත් සමගම මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා වූ පෞද්ගලික ආයෝජනත්, සමස්ත ආයෝජන කටයුතුවල වර්ධනයට දායක වනු ඇත. තවද, සැලකිය යුතු සංඛ්‍යාවක් වූ නේවාසික හා මිශ්‍ර සහාධිපත්‍ය මහල් නිවාස ව්‍යාපෘති මෙන්ම කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය ද පෞද්ගලික ආයෝජනවල වර්ධනය කෙරෙහි දායක වනු ඇත. තවද, ප්‍රමුඛතා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක වීමත් සමගම රජයේ ආයෝජන ද සමස්ත ආයෝජන වර්ධනයට යහපත් ලෙස දායක වනු ඇත. පෞද්ගලික ආයෝජන අපේක්ෂිත මට්ටම කරා ළඟා කර ගැනීම සඳහා ප්‍රතිපත්තිවල පැවති අස්ථාවරභාවය හේතුවෙන් හීන වූ ආයෝජකයින්ගේ විශ්වාසය ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

- **ආර්ථික වර්ධනය තිරසාර මට්ටමක පවත්වා ගැනීම සඳහා ඉතුරුම් අපේක්ෂිත මට්ටමින් පවත්වා ගැනීම ඉතාම වැදගත් වේ.** මේ සඳහා රජයේ ඉතුරුම් ජනනය කිරීම සහ එය තිරසාර මට්ටමක පවත්වා ගැනීම වැදගත් වේ. රජයේ ආදායම ඉහළ නංවාලීමට විචක්ෂණශීලී ක්‍රියාමාර්ග අනුගමනය තුළින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා වන අඛණ්ඩ උත්සාහය, දේශීය ඉතුරුම් වැඩිදියුණු කර ගැනීමටත් ආයෝජන සඳහා අවකාශ වැඩි කිරීමටත් දායක වනු ඇත. තවද, උද්ධමනය පහළ හා ස්ථාවර මට්ටමක පවත්වාගෙන යන අතරතුර දිගුකාලීනව පෞද්ගලික ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම, විදේශීය අරමුදල් මත වූ රඳා පැවැත්ම අඩු කරමින්, ආයෝජන වියදම් සඳහා ඉහළ ඉල්ලුමක් පවතින තත්ත්වයක දී වුවද ඉතුරුම්-ආයෝජන පරතරය පියවීම සඳහා ඉතා වැදගත් වේ.